www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උතුරේ ප්‍රහාරය කඩාවැටීමත් සමඟ ශ්‍රී ලංකා හමුදාව ව්‍යසනයකට මුහුණදෙයි

## Sri Lankan army suffers a debacle as a northern offensive collapses

**සරත් කුමාර විසිනි**
**2008 අප්‍රේල් 29**

පසුගිය සතියේ මුහමාලේ හා කිලාලි ආසන්නයේ මිලිටරි ප්‍රහාරය එල්ටීටීඊය විසින් ව්‍යර්ත කිරීමත් සමඟ ශ්‍රී ලංකා හමුදාව බරපතල ව්‍යසනයකට මුහුන පෑවේය. විපතට පත් සංඛ්‍යාවන් පිලිබඳ පිලිගත හැකි තොරතුරු නොමැති වුව ද අඩුම තරමින් සෙබලුන් 140 ක් මියගොස් 300 කට අධික සංඛ්‍යාවක් තුවාල ලබා ඇත. ආන්ඩුවේ දැඩි මාධ්‍ය වාරනය තුලින් මෙහෙයුමේ තොරතුරු කාන්දුවීමත් සමඟ නිශ්චිතව ම සංඛ්‍යාවන් තවදුරටත් ඉහල යා හැකිය.

ජනාධිපති මහින්ද රාජපක්ෂ 2006 ජූලි මාසයේදී රට යලිත් යුද්ධයට තල්ලු කල අතර එල්ටීටීඊය සමඟ ඇති කර ගෙන තිබූ සටන් විරාමය මේ වසර මුල නිල වශයෙන්ම කටුගා දැමීය. ඔහුගේ හෙලත්තාඩු සහාග ආන්ඩුව ද, ආරක්ෂක සංස්ථාපිතය ද මෙම වසර අවසන් වන විට එල්ටීටීඊය පරදා ඉක්මන් හා පහසු ජයක් අත් කර ගන්නා බවට පොරොන්දු විය. එවන් කොන්දේසි යටතේ කුමන හෝ මිලිටරි පසුබෑමක් ආන්ඩුවට බැරෑරුම් දේශපාලන අර්බුදයක් උද්ගත කිරීමේ ශක්‍යතාවය ගැබ්කර ගනී.

වැසූ දොරවල් පිටුපස පාලක කවයන්ට පැහැදිලි උත්සුකයන් පවතියි. ආරක්ෂක සංස්ථාපිතය සමඟ සමීප සබඳතා ඇති වාර්තාකරුවෙකු වන ෂාමින්ද්‍ර ෆර්ඩිනැන්ඩෝ *අයිලන්ඩ්* පත්‍රයෙහි මෙසේ ලිවීය. එල්ටීටීඊය "යාපනය පෙරමුනේදී එල්ල කල විනාශකාරී ප්‍රති ප්‍රහාරවලින් ආන්ඩුව සොලවා තිබේ. එමඟින් මිලිටරි කටයුතුවල සමස්ත ගමන් මඟ වෙනස්කර නැති නමුත් ක්ෂයවී ඇති ප්‍රහාරක බලඇනි පිලිසකර කිරීම දුෂ්කර කාර්යයක් වනු ඇත."

ප්‍රසිද්ධියේ, ආන්ඩුව හා හමුදා නායකයන් මරන සංඛ්‍යාව ද ඇතුලත්ව පරාජයේ තොරතුරු වසං කිරීමේ වියරු උත්සාහයක යෙදී සිටිති. මාධ්‍යකරුවන් තුවාල ලැබූ සෙබලුන් හා ඔවුන්ගේ ඥාතීන් සමඟ කථාකිරීම වලැක්වීම සඳහා පොලිසිය හා හමුදාව අවමංගල සේවා ආයතන හා ආරෝග්‍යශාලා තුල ස්ථානගත කර තිබුනි. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කොලඹ ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයේ වෛද්‍ය අනිල් ජයසිංහගෙන් කල විමසුමකදී ඔහු කියාසිටියේ තොරතුරු නොදෙන ලෙසත් මාධ්‍යකරුවන්ට පැමිනීමට ඉඩ නොදෙන ලෙසටත් තමාට "ඉහලින්" අන ලැබී ඇති බවය.

අප්‍රේල් 23 වන දින ශ්‍රී ලංකාවේ උතුරෙහි සිදුවූ දේ පිලිබඳ නිල විස්තර කථනයන්, මඟහැරීමෙන් ද ව්‍යාකූලත්වයෙන් හා බොරුවෙන් ද පිරී තිබුනි. ආන්ඩුවේ හා මිලිටරියේ ප්‍රකාශකයන් සිදුවූයේ අසාර්ථක ප්‍රහාරයක් හෝ රැක සිට පහරදීමක්ය යන්න ප්‍රතික්ෂේප කරමින් දිගටම අවධාරනය කලේ එල්ටීටීඊ ප්‍රහාරයෙන් පසුව හමුදාව එල්ටීටීඊයේ පෙරටු රැකවල් අල්ලාගත් බවය. කෙසේවුවද ලෝසවෙඅ ට අදහස් දක්වමින් තුවාල ලැබූ සෙබලුන් නිශ්චිතව කියාසිටියේ ඉදිරියට යන ලෙස තමන්ට අන ලැබුන බවත් මරඋගුලක් වෙත පා තැබූ බවත් ය.

බදාදා හිමිදිරියේ 2.30 ට පමන ආරම්භවූ සටන එදින දහවල් 12.40 වන තෙක්ම පැවතියේ ය. යාපනය අර්ධද්වීපය දිවයිනේ අනෙකුත් කොටස් සමඟ යා කෙරෙන ගෙලක් වැනි කිලෝ මීටර් 7ක් පලල පටු බිම් තීරුවක සටන් ඇවිලී තිබුනි. පැහැදිලිව ම ප්‍රහාරයේ අරමුන වූයේ දකුනට වන්නට පිහිටි වසර 2000 දී හමුදාවට අහිමි වූ මූලෝපායිකව වැදගත් අලිමංකඩ ද ඇතුලු එල්ටීටීඊ කඳවුරු අල්ලා ගැනීම ය. එතැන් සිට වන්නි ප්‍රදේශයේ එල්ටීටීඊ මධ්‍යස්ථානය වන කිලිනොච්චිය ද ඇතුලු බල කඳවුරුවලට පහසුවෙන් ප්‍රහාර එල්ල කල හැකිය.

27වන ඉරු දින *සන්ඩේ ටයිම්ස්* හි ''තත්ව වාර්තාව" තුල ඉදිරි ආරක්ෂක වලල්ලේ දිරිසුන් චිත්‍රයක් සටහන් විය. "මුහමාලේ සුවදායක නොවන බිම්කඩක් බව ඕනෑම සෙබලෙකු දන්නා දෙයකි. එහි හිරු බබලන විට ඔවුන්ගේ අත්ලෙහි තිබෙන බත් පිඟාන සුලඟට හමායන සිහින් දූවිලි වැල්ලෙන් වැසී යයි. වර්ෂාව සහිත අනෙකුත් කාලවලදී බිම මඩ ගොහෙරුවක් හා මදුරුවන්ගේ තර්ජනය සහිතය."

මෙම මාසයේ මුල උතුරේ යුද කලාපයෙහි සංචාරයක් සඳහා තෝරාගත් මාධ්‍යවේදීන් අතලොස්සගෙන් එක් අයෙකු වූයේ එම පත්‍රයේ ඉක්බාල් අතාස්ය. මිලිටරිය ප්‍රධාන ප්‍රහාරයකට සූදානම් වීම ගැන ඔහුට සැකයක් තිබුනේ නැත. "උතුරේ සමහර ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් ඒ බව ඉඟිකර තිබුනි ය." යි ඔහු ප්‍රකාශ කලේය. මෙහෙයුමේ කාල වකවානුව සලකන කල එය මැයි මස 10 වන දින පැවැත්වීමට නියමිත නැගෙනහිර පලාත් සභා ඡන්ද ව්‍යාපාරයට සම්පාත වෙයි. මිලිටරි ජයග්‍රහනයක් ඡන්දය දිනාගැනීමේ සිය අවස්ථාවන්ට

තල්ලුවක් සපයනු ඇතැයි ආන්ඩුව ගනන් බැලූ බව නිසැකය. අප්‍රේල් 24 වන දින ඩේලි මිරර් පත්‍රය වාර්තා කලේ හමුදාපති සරත් ෆොන්සේකා යාපන අරධද්වීපයේ සංචාරය කරමින් ඉදිරි යුද සැලසුම් පිලිබඳව ඉහල පෙලේ හමුදා නිලධාරීන් සමග සාකච්ඡා පවත්වා පැය හයක් ගතවීමටත් මත්තෙන් ප්‍රහාරය සිදුවූ බවය. වසර මුලදී ෆොන්සේකා උදම් ඇනුවේ වසර අවසානයේ තමන් විශ්‍රාම යාමට ප්‍රථමයෙන් "ත්‍රස්තවාදී" ප්‍රශ්නය අවසාන කරන බවටය.

ආරක්ෂක ප්‍රකාශක උදය නානායක්කාර මුලින් අවධාරනය කලේ එය ආරක්ෂක මිස ප්‍රහාරක මෙහෙයුමක් නොවූ බවයි. ආරක්ෂක හමුදා "එල්ටීටීඊ ප්‍රහාරය මැඬපැවැත්වූ" බව ඔහු ප්‍රකාශ කලේය. මිලිටරියට සිදුවූ හානි සුලු ඒවා බවත් හමුදාව එල්ටීටීඊයේ දැඩි රැකවල් සහිත ඉදිරි ආරක්ෂක පෙල අල්ලාගනිමින් හටයන් 52 ක් මරාදමා 100කට වැඩි සංඛ්‍යාවකට තුවාල සිදු කල බව ඔහු කියා සිටියේය. පසුව කිසිදු හේතු දැක්වීමකින් තොරව ඔහු එල්ටීටීඊ මරන සංඛ්‍යාව 100 දක්වා වැඩිකරමින් හමුදාව මීටර් 500 ක් ඉදිරියට ගිය බව කියාසිටියේය.

කෙසේ වුවද කථාන්තරය ඉක්මනින්ම කුඩුපට්ටම් විය. 24 වන බ්‍රහස්පතින්දා දහවල් වනවිට සෙබලුන් 43 දෙනෙකු මියගොස් 160ක් තුවාල ලැබූ බව පිලිගැනීමට මිලිටරියට සිදුවිය. තවත් 33 දෙනෙකු අතුරුදහන්ව ඇතිබව වාර්තා විය. ගනන් වෙනස් කිරීමට සිදුවූයේ සෙබලුන් 28 දෙනෙකුගේ මලසිරුරු එල්ටීටීඊය විසින් ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට (අයිසීආර්සී ) බාරදීමෙන් පසුවය. මෙහිදී මතුවන නිශ්චිත ප්‍රශ්නය වන්නේ හමුදාව ඉදිරියට යන්නේ නම් එල්ටීටීඊය යුද බිමේදී මලසිරුරු අත්කර ගත්තේ කෙසේද යන්නයි. මිලිටරිය කිසිදු පැහැදිලි කිරීමක් නොකරයි.

හමුදා මරන තවත් වැඩි බව ඇඟවුම් කරන වාර්තා බ්‍රහස්පතින්දා පලවිය. යුද්ධයට පූර්න පිටුබලය සපයන අයිලන්ඩ් පත්‍රය ගනන් බලා ඇත්තේ මරන 140 ක් හා තුවාලකරුවන් 200 ක් බවය. *ලංකා -ඊ-නිව්ස්* වාර්තා කලේ එල්ටීටීඊය අයිසීආර්සී වෙත බාරදුන් මලසිරුරු හැර කොලඹ හා අවට අවමංගල්‍ය ආයතන තුනකට පමනක් බාරදී ඇති සිරුරු ගනන 143 ක් බවය. හමුදා සාමාජිකයන් 368 දෙනෙක් තුවල ලැබූ බවත් ඉන් 286 කගේ තත්වය බරපතල බවත් වෙබ් අඩවිය වාර්තා කලාය. එල්ටීටීඊයට පක්ෂ *ටැමිල්නෙට්* වෙබ් අඩවිය, අල්ලාගත් අවි ආයුධ හා වෙඩි උන්ඩ විශාල සංඛ්‍යාවක ýජායාරූප පලකල අතර එල්ටීටීඊ හටයන් 25 ක් මියගිය බව පිලිගත්තේය. ගැටුමට සම්බන්ධ දෙපාර්ශවය ම සිය "ජයග්‍රහන" පුම්බාලීමටත් හානි අවම කිරීමටත් කුප්‍රකටය. යුදබිමේ සිට ස්වාධීනව කිසිවක් වාර්තාකිරීම ආන්ඩුව තහනම්කර තිබේ.

බ්‍රහස්පතින්දා පැවති මාධ්‍ය හමුවකදී ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල මාධ්‍යකරුවෙකු නැගූ ප්‍රශ්නවලට පහත දැක්වෙන පරිදි දුන් පිලිතුරුවලින් නිල ප්‍රතිචාරයේ මගහැරීමේ ස්වභාවය විදහා දැක්වේ.

ප්‍රශ්නයඃ සමහර වාර්තාවල දැක්වෙන ආකාරයට මෙය මිලිටරිමය වශයෙන් ව්‍යසනයක් ද?

කෙ. ර.ඃ නිශ්චිතවව ම එසේ නොවේ. අලිමංකඩදී 1500 ක් දෙනා මියගිය අවස්ථාව වැනි තැන්වලදී ව්‍යසනයන් සිදුවී තිබේ.

ප්‍රශ්නයඃ එය පසුබෑමක් ද?

කෙ. ර.ඃ අප ඉදිරියට ගමන් කර තිබෙන නිසා එය පසුබෑමක් නොවේ. අප පසුපසට ගමන්කලේ නම් ඔබට එය පසුබෑමක් ලෙස දැක්විය හැකිය.

ප්‍රශ්නයඃ එය සිදුවූයේ හමුදාව ඉදිරියට ගමන්ගන්නා විට ඔවුන්ට පහරදීමට එල්ටීටීඊය ඔවුන්ගේ කාලතුවක්කු හා මෝටාර් අවි සූදානම් කරගෙන සිටි නිසාද? මෙය නොවරදවාම රැක සිට පහරදීමකි. ඉන් පෙනීයන්නේ හමුදාව එල්ටීටීඊයේ උගුලට හසුවූ බවයි.

කෙ. ර.ඃ යමෙකුට එසේ කිව හැකිය. මේ වර්ගයේ එනම්, තිස් වසරක් පැරනි යුද්ධයක යෙදී සිටින විට අප හිරවීම්වලට මුහුනපානවා. අප මුහුන දුන් දරුනු සටන් අතරතුර එය සාමාන්‍ය දෙයකි. හමුදාව සැලකිල්ල දක්වන්නේ තමන් ඉදිරියට ගමන්කොට ඇති බවට ඔවුන් තුල ඇති විශ්වාසයේ තරමටයි. ඔවුන් හොඳින් ස්ථානගතවී සිටිති. ඉලක්කය එයයි. ඔවුන් මීටර් 500 ක් ඉදිරියට ගොස් තිබේ.

## දේශපාලන මංමුලාව

රඹුක්වැල්ලගේ ප්‍රකාශයන් තුලින් හමන්නේ පසුගිය දෙවසරක සටනින් මියගිය, අංගවිකලවූ හෝ අවතැන්වූ දහස්ගනන් සිවිල් වැසියන්ගේ ජීවිත ගැන නොකීව ද, සොල්දාදුවන්ගේ ජීවිත ගැන පවා දක්වන නරුම නොතැකීමේ දුර්ගන්ධයයි.

2006 ඔක්තෝබරයේදී අසාර්ථකවූ මෙහෙයුමකින් සෙබලු 400 කගේ ජීවිත වැනසී ගියතැන් පටන් එම ප්‍රදේශයේදී ම ශ්‍රී ලංකා හමුදාවට හානි සිදුවූ නරක ම තනි සිද්ධිය පසුගිය සතියේ "හිරවීමයි." පසුගිය නොවැම්බරයේ මුහමාලේ ප්‍රදේශයේදී සිදුකල තවත් එවැනිම මිලිටරි මදාවියක් කෙලවර වූයේ ද සෙබලු විශාල සංඛ්‍යාවකගේ ජීවිතවලින් වන්දි ගෙවූ පරාජයකිනි. එල්ටීටීඊයේ උතුරු බල කඳවුරු අත්පත්කර ගැනීමේ නව උත්සාහය වෙනුවෙන් හමුදා හටයන් සිය ගනනක් නොවේ නම් විශාල ගනනකගේ ජීවිත නිකරුනේ බිලිදීමේ එවන් තීරනවලින් පෙන්නුම් කරන්නේ ආන්ඩුවේ මංමුලාවේ තරමයි. 2006 වසරේ ජූලි මාසයේ පටන් ශ්‍රීලංකා ආරක්ෂක හමුදාවන්ට 2004 දී එල්ටීටීඊයේ පසු පෙල හටයන් අතර ඇතිවූ ප්‍රධාන භේදයක් උපයෝගී කරගෙන එහි නැගෙනහිර කඳවුරුවලින් එල්ටීටීඊය සාපේක්ෂව පහසුවෙන් පලවාහැරීමට හැකි විය.

පසුගිය ජූලියේ "නැගෙනහිර ජයග්‍රහනයේ" දේශප්‍රේමී උනුසුම මධ්‍යයේ ආන්ඩුව හා හමුදාව සිය අවධානය උතුරට යොමු කලේය. වයඹදිග මන්නාරම් දිස්ත්‍රික්කයේ උග්‍ර සටන් ඇවිලී ගියේය. ජනවාරියේදී ඊසානදිග වැලිඔය ප්‍රදේශයේ තවත් පෙරමුනක් විවෘත

විය. කෙසේ වුව ද බිත්තියටම හේත්තු වී සිටි එල්ටීටීඊය හමුදාවේ සෑම ඉදිරි පියවරකදීම දැඩිලෙස ප්‍රතිරෝධය දැක්වීම නිසා සටන් එරී ගියේය.

මුහමාලේ ප්‍රහාරය වනාහි එලටීටීඊයේ මූලික බල මධ්‍යස්ථානවලට තර්ජනයක් වියහැකි තුන්වන පෙරමුනක් විවෘත කරගැනීමේ කඩිනම් උත්සාහයක් විය. එම සතියේ අසාර්ථකත්වයට ආන්ඩුව ප්‍රතිචාර දැක්වූයේ එල්ටීටීඊ ප්‍රදේශවලට බිහිසුනු ගුවන් ප්‍රහාර එල්ල කිරීමෙනි. බදාදා සවස ම ගුවන් හමුදා ප්‍රහාරක යානා හා හෙලිකොප්ටර් මුහමාලේ එල්ටීටීඊ කඳවුරු බව කියාසිටි තැන්වලට පහර දුන්නේය. බ්‍රහස්පතින්දා එල්ටීටීඊ මරාගෙන මැරෙන බෝම්බකරුවන් පුහුනුකරන ස්ථානයක් ලෙස හඳුනාගත් බව කියන පනික්කන්කුලමට පහරදුනි.

"ජයග්‍රහනයක්" ප්‍රකාශයට පත් කිරීමේ මංමුලාව මධ්‍යයේ සති ගනනක් තිස්සේ උග්‍ර සටන් ඇතිවූ මන්නාරම් දිස්ත්‍රික්කයේ කතෝලික මඩු පල්ලිය ආන්ඩුවේ හමුදාවන් විසින් අල්ලා ගත්තේය.

මුහමාලේ ප්‍රහාරය බිඳවැටී දෙදිනකට පසුව පිලියන්දලදී කාල බෝම්බයක් පුපුරා ගියේය. ලමුන්, ගැහැනු හා පිරිමි සිවිල් වැසියන් 29 දෙනෙක් මරුමුවට පත්විය. දෙමල බෙදුම්වාදයේ ප්‍රතිගාමී වාර්ගික දෘෂ්ඨිය මත පදනම්ව සිටින එල්ටීටීඊය මීට පෙර ද එවන් භීෂනයන් සිදුකර ඇති අතර මෙය ද ඔවුන්ගේ වැඩක් විය හැකිය. එහෙත් වත්මන් තත්වයේදී මිලිටරිය හෝ එහි පැරා මිලිටරි කන්ඩායමක් ආන්ඩුවට හා එහි ස්වෝත්තමවාදී ආධාරකරුවන්ට යුදවාදී උන්මාදය ඇවිලවීම ට හැකිවන පරිදි බෝම්බය පුපුරවා හැරියා ද විය හැකිය.

යුද්ධය කෙරෙහි වර්ධනය වන විරෝධයක සලකුනු දක්නට ඇත. 2005 නොවැම්බරයේදී බොහෝ දෙනෙක් යුද්ධය ඇරඹීමට නොව නිමාකිරීමේ අපේක්ෂාව සහිතව රාජපක්ෂට ඡන්දය දුන්හ. සිදුවෙමින් ඇති ජීවිත හානි හා විනාශය පමනක් නොව යුද්ධයේ ආර්ථික ප්‍රතිවිපාකයන්ගේ බරට ද කරගැසීමට සිදුව ඇති වැඩ කරන ජනතාවගේ කෝපය මුහමාලේ ව්‍යසනයෙන් තවත් උග්‍ර කෙරෙනවා පමනි. දැනටමත් ඉහල යන ආහාර හා ඉන්ධන මිලගනන් මගින් නිර්මානය කර ඇති උද්ධමනයට, අහස උසට නගින මිලිටරි වියදම් ද තවදුරටත් තල්ලුව සපයයි.

පසුගිය සතියේ ඩේලි මිරර් පත්‍රයේ ප්‍රකාශන වලින් යුද්ධය කෙරෙහි හා සියලු පක්ෂවල වාර්ගික දේශපාලනය කෙරෙහි පතුලෙන් නැගෙන විරුද්ධත්වයේ ඡායාමාත්‍රයක් ගෙනඑයි.

එක් පාඨකයෙකු මෙසේ ලියා ඇත. " සොහොයුරනි-සොයුරියනි, මෙම යුද්ධය දිනිය නොහැකිය, මෙම යුද්ධයට සහාය දක්වන අය කරුනාකර බංකර් තුල මැරී සිටින අපගේ නිර්භීත සෙබලුන්ගේ ඡායාරූප දෙස ඇස් ඇර බලන්න. ඔවුන් එසේ මිය යා යුතුද? අපගේ සොල්දාදුවන්ගේ ජීවිත පූජා කිරීමෙන් අප ලබාගන්නේ කුමක් ද? ලංකා මාතාවගේ දැවැන්ත සොහොන් බිමකි."

තවත් අයෙක් මෙසේ ලිවීය: "මෙම කථාව ඇසීම කනගාටුවට කරුනකි. ජනවර්ග දෙකට ම අයත් අපගේ කොල්ලන් ඔවුන්ගේ නායකයන්ගේ ලේ පිපාසාව නිසා මිය යමින් සිටිති."

තුන්වන පාඨකයා මෙසේ ලිවීය: "මගේ දෙවියනි, අප මනුෂ්‍ය ජීවිත ගැන කථා කරන්නෙමු. ඔවුන් යම් ශ්‍රී ලාංකික පුතුන් සොහොයුරන් පියවරුන් නොවන්නේ ද? මෙය මෙම ධර්මද්වීපය තුල සිදුවිය යුතුද? මෙම යුද්ධයෙන් වාසි ලබන්නෝ කවරහුද? දේශපාලන න්‍යායපත්‍රයකට අනුව යුද්ධයක් ගෙනයාමේදී සිදුවන්නේ මෙයයි. සිය සෙනෙහෙබර සාමාජිකයන් අහිමිවූ මෙම පවුල් ගැන මඳක් සිතා බලන්න. දැන් නම් හොඳටම ඇති. ශ්‍රී ලාංකිකයන් අනෙක් අය මෙන් මූලධර්මවාදීන්, ස්වොත්තමවාදීන් හෝ උන්මත්තකයන් වීම අවශ්‍යවන්නේ නැත."

ආන්ඩුවේ ප්‍රකාශක රඹුක්වැල්ල සිය මාධ්‍ය හමුවේදී අලිමංකඩ ව්‍යසනය ගැන සඳහන් කිරීම අහම්බයක් නොවේ. මිලිටරිය උතුරේ සිය හමුදාවන් මුලුමනින්ම බිඳවැටීමක් යාන්තමින් මගහරවාගැනීමෙන් පසුව වසර 2000 දී ඇවිලීගිය දේශපාලන අර්බුදය පිලිබඳව ආන්ඩුව හොඳින්ම සංවේදීව සිටියි. එල්ටීටීඊය මිලිටරි කඳවුර අත්පත් කර ගත්තා පමනක් නොව යාපනය අර්ධද්වීපයෙහි හිරවී සිටි දස දහස් ගනනක හමුදාවන්ට ද තර්ජනයක් විය.

යුද්ධය ආරම්භ කිරීමෙන් පසුව රාජපක්ෂගේ කොලඹ යුදවාදී කල්ලිය, හදිසි නීති පාලනය, හිතුමතයේ රඳවාතැබීම හා රාජ්‍ය ත්‍රස්තය යොදාගනිමින් විවේචන හා විරෝධතා මැඩපැවැත් වීය. සිය ගනන් ජනයා මිලිටරියේ අනුග්‍රහය ලත් මිනීමරු කල්ලි විසින් "අතුරුදහන්කර" හෝ මරාදමනු ලැබුනි. මුහමාලේ පරාජය පිලිබඳ ඕනෑ ම වාර්තා කිරීමක් පාගා දැමීමේ උත්සාහය ඉදිරි කාලය සඳහා ඊටත් වඩා කුරිරු ක්‍රමවේදයන් සූදානම් කෙරෙමින් තිබෙන බවට අනතුරු ඇඟවීමකි.

© www.wsws.org